# තනි පද-8

***වචන කිහිපයක් වෙනුවට යෙදිය හැකි තනි වචන තනි පද නම් වේ***

*උදා :-* අනුන් ගැන සිතන්නා - පරාර්ථකාමී

1) ස්වාමියා මළ ස්ත්‍රිය - වැන්දඹුව
2) ජලය නැති කාලය - ඉඩෝරය
3) පාගන ලද ගොයම - මැඩවුම
4) කිරි බී වැඩෙන - ක්ෂීරපායී
5) විවාහයට පත් නොවූ කාන්තාව - මෙනවිය
6) විවාහ නොවූ - තනිකඩ
7) යමෙක් හෝ යම් සිද්ධියක් සිහිවීම පිණිස තනා ඇති දෙය - ස්මාරකය
8) උපසම්පදා නොවූ භික්ෂුව - සාමනේර
9) ප්‍රමාණය කළ නොහැකි - අපරිමිත
10) ඇසෙහි ගාන ආලේපය - නයනාලේපය
11) ඇස් වලට ප්‍රතිකාර කරන රෝහල - නයනාරෝග්‍යශාලාව
12) පසුපස එළවා යෑම - ලුහුබැඳීම
13) සතුන් පැමිණීම වැළැක්වීමට හේන වටා බඳින වැට - දඬු වැට
14) ඔටුනු පැළඳවීමේ උත්සවය - මෞලි මංගල්‍යය
15) මගීන්ට පහර දී ඔවුන් සතු දේ උදුරා ගැනීම - කොල්ලකෑම
16) කුඹුරක ලියද්දකින් ජලය බසින තැන - වක්කඩ
17) මළ අයකුගේ සිරුර පිළිස්සීම - ආදාහනය
18) මළ අයකුගේ සිරුර පොළොවේ වැළලීම - භූමිදානය
19) පොත්පත් ආදිය ලියන තැනැත්තා - ලේඛකයා
20) සේනාවක සිටින ප්‍රධානියා - සේනාධිපති